ඇබෑර්තු

සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව තුළ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු -

1. අලෙවි කළමනාකරු (කොන්ත්‍රාත් පදනම මත)
2. වාණිජ කළමනාකරු (කොන්ත්‍රාත් පදනම මත)
3. අභ්‍යන්තර විගණක (කොන්ත්‍රාත් පදනම මත)
4. නීති නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත)

1. අලෙවි කළමනාකරු - (ගිවිසුම් පදනම මත) තනතුරු - 01

සුදුසුකම් -

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් වාණිජ / ව්‍යාපාර පරිපාලන / අලෙවිකරණ ක්ෂේත්‍රයේ උපාධියක්.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

හෝ

වාණිජ / ව්‍යාපාර පරිපාලන / අලෙවිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටමට නොඅඩු වන නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සහ

රජයේ සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්ද.

2. වාණිජ කළමනාකරු - (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු - 01

සුදුසුකම් -

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් වාණිජ / ව්‍යාපාර පරිපාලන / අලෙවිකරණ ක්ෂේත්‍රයේ උපාධියක්.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

හෝ

වාණිජ / ව්‍යාපාර පරිපාලන / අලෙවිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සහ

රජයේ සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්ද.

3. අභ්‍යන්තර විගණක (කොන්ත්‍රාත් පදනම මත) - තනතුරු - 01

සුදුසුකම් -

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකාරී / මූල්‍ය කළමනාකරණ / වාණිජ ක්ෂේත්‍රයේ උපාධියක්.

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ වන, පිළිගත් වෘත්තීය වරළන් ආයතනයක අන්තර් මධ්‍ය විභාගය (intermediate examination) සමත්ව තිබීම.

සමග

සුදුසුකම් ලැබීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා වන අතර, අභ්‍යන්තර විගණනයට අදාළ සියලු කටයුතු සම්බන්ධයෙන් සභාපතිවරයාට වගකිව යුතුය; මූල්‍ය මෙහෙයුම්වල අභ්‍යන්තර පාලන පද්ධතියට සහභාගී වීම, මූල්‍ය මෙහෙයුම්වල අඛණ්ඩ සමීක්ෂණ සිදු කිරීම, අභ්‍යන්තර පරීක්ෂණවල සථාවරත්වයේ ප්‍රමාණවත් බව, දේෂ හඳුනා ගැනීම, වංචා හඳුනා ගැනීම සහ ගිණුම්කරණ ඌනතා, දේෂ නිවැරදි කිරීමට සහ වැළැක්වීමේ පියවරයන්ට සහය වීම, විශේෂ විමර්ෂණ, චිතය කටයුතු සම්බන්ධ මූලික වාර්තා සකස් කිරීම, සභාපතිවරයා වෙත වාර්තා ඉදිරිපත් කිරීම, වාර්තා පවත්වා ගැනීම වාර්තා සකස් කිරීම, යටත් නිලධාරීන් මෙහෙයවීම සහ ක්‍රියාකාරීත්වය පහසු කිරීම සඳහා වන වෙනත් ඕනෑම වගකීමක් දැරීම.

4. නීති නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත) - තනතුරු - 01

සුදුසුකම් -

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් (LLB).

සමග

නීතිඥවරයකු වීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ හෝ පිළිගත් වෙළඳ ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

ඔවුන්ගේ ආයතනය තුළ ඇති සියලුම නීතිමය කටයුතු අධීක්ෂණය කිරීම, අභ්‍යන්තර හා බාහිර නීතිමය ගැටලු දෙකම හැසිරවීම සහ ආයතනය නීතිමය කරදරවලින් තොරව තබා ගැනීමට ඔවුන්ගේ බල තළ යටතේ ඇති සියල්ල කිරීම සඳහා වගකිව යුතුය.

- නීතිමය උපදෙස් ලබා දීම සහ නීතිමය ගැටලු සහ උපදේශන සඳහා සහාය වීම
- නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම සහ ආයතනය වෙනුවෙන් අධිකරණය හමුවේ පෙනී සිටීම
- සියලුම නීතිමය කටයුතු හැසිරවීම

පොදු කොන්දේසි

1. අයැදුම්කරු - ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
2. කොන්ත්‍රාත් වැටුප - රු. 99,510/= (MM -1-1) (සියලු දීමනා සහිතව).
3. වයස - වයස අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
4. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අයැදුම්පත් ආයතන ප්‍රධානීන් හරහා එවිය යුතුය.
5. සහතිකවල පිටපත් සහ (ඡූතිත්වයක් නැති) නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිත ජීව දත්ත පත්‍රිකාව (Bio-data) 2026 දෙසැම්බර් 07 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
6. බඳවා ගැනීමෙන් පසු, කාර්ය සාධනය KPI මගින් මැන බලනු ලැබේ.

සභාපති,
සී/ස. ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව,
අංක 541, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.